තුනුක්කායි ප්‍රාදේශීය සභාව
මුලතිව් දිස්ත්‍රික්කය
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීත්, ඒවා ඉදිරිපත් කිරීමේදීත් අනුගමනය කළ යුතු පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති නියමිත අයුරින් අනුමත කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට සභාවේ ලේකම්වරයා සහ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරනු ලැබේ. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රකාශනවල විවිධ ප්‍රමාණයන්ගෙන් ඒවායේ වටිනාකම් තක්සේරු නොකළ ඉඩම් කැබැලි 30ක් සහ එකතු වටිනාකම රු. 1,917,672 ක්වූ වෙනත් ඉඩම් හතරක් | සභාවට අයත් දේපල සම්බන්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අදහස් එකහතාවයන් සහ අනුමැතිය | අදාල ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලබාගැනිම සඳහා ඉඩම් කොමසාරිස් මාර්ගයෙන් කටයුතු කර ඇති අතරඉඩම් තක්සේරු |

| | | | |
|---|---|---|---|
| | ද පැවැතුණි. කෙසේවෙතත් මේවා සඳහා හිමිකම් ඔප්පු, ඉඩම් මිනින්දෝරු සැලැසුම් සහ තක්සේරු සහතික ඉදිරිපත් නොවීමෙන් විගණනයේදී සතුටු දායක ලෙස සතෝක්ෂණය කිරීමට නොහැකි විය. | අනුව එමගින් ඉඩම් හිමිකම් ඔප්පු ලබාගෙන මිනින්දෝරු ප්ලෑන මඟින් සාක්ෂි සමඟ අනුමත මිල තක්සේරුකරු හෝ රජයේ තක්සේරුකරුගෙන් ඒවායේ වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට ක්‍රියාමාර්ග ගත යුතුය. | කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන්ද ඉල්ලීම් සිදු කර ඇත. |
| (ii) | ගෙවීම් 07ක් සඳහා එකතුව රු.3,600,338 ප්‍රමාණ පත්‍ර,කර්මාන්තය අවසන් කිරීමේ සාක්ෂි, ප්‍රසම්පාදන කමිටු තීරණ සටහන් වැනි ලේඛන ඉදිරිපත් නොකිරීමෙන් විගණනයේදී සතුටු දායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව සහතික කිරීමෙන් පසුව පමණක් ගෙවීම් සිදු කළ යුතුවේ. | දැන් තහවුරු කිරීම් සිදු කර ඇත. |

**(ඇ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන පනතේ VII පරිච්ඡේදයේ 17 වගන්තියේ උප වගන්ති 168 (i) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කිරීමේදී කාල ප්‍රමාදයන් සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන මාර්තු 31 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | සියළුම ක්‍රියාමාර්ගයන් 2020 මූල්‍ය වර්ෂයේ නිවැරදි කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය මෙම වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | පරිච්ඡේදය II d රීති 66 | රු. 10,189,336ක් වූ සභාවේ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වාර්ෂිකව හිඟ ආදායම් නියමිත අයුරින් අයකරගැනීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. | • මෙහි බදු අයකිරීම් රු.86,681.26ක් සම්බන්ධයෙන් නඩු පවරා ඇති අතර අදාල පුද්ගලයා මිය යෑම නිසා හිඟ මුදල් කපා හැරීම සඳහා කටයුතු කර ඇත.<br>• උසාවි දඩ මුදල් මින් පසුව එළෙඹෙන කාලයේදි ලැබෙනු ඇත. අයකළ වාරික, ත්‍රිරෝද රථ බදු රු.64,450.00ක රිසිට්පත් අමුණා ඇත.<br>• මුද්දර ගාස්තු රු.252,549.00ක් ලැබී ඇත. ඉතිරි රු.1,485.00ක් ලබා ගැනීම සඳහා ලිපි යවා ඇත. |
| (ii) | පරිච්ඡේදය III රීති 32 | සභාව විසින් වරිපනම් බදු තක්සේරු ලේඛන පවත්වා නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු ලේඛන නඩත්ත් කර වාර්ෂිකව යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුවේ. | අප සභා බල ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.එයට අනුකූලව වරිපනම් බදු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | පරිච්ඡේදය III<br>රීති 33 | වරිපනම් බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු කිරීම් කඩිනමින් සිදුකර වරිපනම් බදු ගණනය කර වාර්ෂිකව වරිපනම් බදු සෑම කාර්තුවකම සභා බල ප්‍රදේශයට අයත් දේපලවලින් නියමිත පරිදි අයකිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. | අප සභා බල ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.එයට අනුකූලව වරිපනම් බදු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. |
| (iv) | පරිච්ඡේදය III<br>රීති 59,60 | ව්‍යාපාර බදු සම්බන්ධයෙන් තක්සේරුවක් පැවැත්වීම සඳහා කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු පිළිබඳ තක්සේරුවක් පැවැත්වීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. | අප සභා බල ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.එයට අනුකූලව ව්‍යාපාර බදු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. |
| (v) | පරිච්ඡේදය IV<br>රීති 108 | තුනුක්කයිහි පිහිටි සභාව වෙත පවරන ලද ළමා උද්‍යානය නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත පවරන ලද ළමා උද්‍යානය නිසි ලෙස නඩත්තු කර ළමයින්ට භාවිතා කිරීමට හැකි ආකාරයෙන් වෙනස් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි සභා අරමුදලින් හෝ/වෙනත් මූලාධාරවලින් හෝ මේ සඳහා ප්‍රතිපාදන සලසාගෙන කාර්යයන් අවසන් කර උද්‍යානය භාවිතය සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (vi) | පරිච්ඡේදය IX<br>රීති 180 | මුදල් හා ගබඩා භාරව කටයුතු කරන නිලධාරින්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | මුදල් හා ගබඩා භාරව කටයුතු කරන නිලධාරින්ගෙන් නියමිත කාලය තුළ ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉහත සඳහන් පරිදි අප සභාවේ මූල්‍ය අත්සන් කිරීමේ නිලධාරියා, දෙවැනි අත්සන් කිරීමේ නිලධාරියා ගබඩාව භාර කළමනාකාර සහකර සහ රියැදුරන් 04දෙනෙකුගෙන් ඇප මුදල් තැන්පත් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන අත්පොත | | | |
| | ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු මුදල් ගෙවූ පසු එහි තොරතුරු ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය | සඳහන් කර ඇති ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 මාර්ගෝපදේශය | සභාව විසින් ගෙවනු ලබන VAT සම්බන්ධ විස්තර ඉදිරියේදී අදාල කාලපරිච්ඡේදය තුළ |

| | | | | |
|---|---|---|---|---|
| | | ආදායම් කොමසාරිස්වරයාටත් එහි පිටපතක් විගණකාධිපතිවරයාටත් යවා නොතිබුණි. | ප්‍රකාරව කිසියම් මාසයක ගෙවන ලද එකතු කළ අගය මත බදු තොරතුරු වහාම ඊළඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. | දේශීය ආදායම් කොමසාරිස්වරයාටත් එහි පිටපතක් විගණකාධිපතිවරයාටත් යැවීමට කටයුතු කරනු ලැබේ. 2019 වර්ෂයේ සිට යවනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 137 | සභාවේ සභාපතිවරයා විසින් සහතික නොකර ලිපිද්‍රව්‍ය මිලදී ගෙන රු. 73,150ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව සහතික කිරීමෙන් පසුව පමණත් සිදු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි 137 පිළිබඳව සඳහන් නිරීක්ෂණයන් සම්බන්ධයෙන් සියළුම කටයුතු සිදුකර නිවැරදි කර ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නොකර වර්ෂ 02 සිට වර්ෂ 05ක් දක්වා රු. 93,947ක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කාලය ඉක්ම වූ තත්ත්වයේ පැවති මෙවැනි තැන්පතු විධිමත්ව පරිශීලනය කර ආපසු ගෙවීමට හෝ නිරවුල් කිරීමට හෝ නැතහොත් විධිමත් අනුමැතීන් සහිතව රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කළ යුතුය. | කල් ඉකුත්වූ තැන්පතු 07කින් තැන්පතු 04ක් සමුච්චිත අරමුදලට මාරු කර ඇත. ඉතිරි ඒවායෙන් එක් තැන්පතුවක් ආපසු ගෙවා ඇත. එකක් සමුච්චිත අරමුදලට මාරු කිරීමට කටයුතු කර ඇත. එක් තැන්පතුවක් සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-----------------------<br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍ර ලේඛය | සභාවේ වාහන 09ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | සභාවේ භාවිතයේ ඇති ඉන්ධන පරිභෝජනය සියළුම වාහන සඳහාත් විධායක මට්ටමේ නිළධාරියෙකු ඉදිරියේ අවම වශයෙන් වර්ෂයකට වරක් හෝ ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර තහවුරු කර වාහන දෛනික ධාවන සටහන් මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. එසේ වුවත්, මෙම වර්ෂයේ 2019 ජූලි 02 දින පරීක්ෂාවන් සිදු කරන ලදි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,337,630 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 9,543,402 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 4,485,450 | 2,656,630 | 2,609,480 | 151,131 | 4,368,000 | 2,261,422 | 2,141,522 | 119,900 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 1,054,000 | 796,000 | 796,000 | – | 215,000 | 293,500 | 293,500 | – |
| (iii) | වෙනත් ආදායම් | 6,847,500 | 11,895,397 | 4,776,856 | 10,038,205 | 4,000,000 | 5,050,879 | – | 5,050,879 |
| | එකතුව | **12,386,950** | **15,348,027** | **8,182,336** | **10,189,336** | **8,583,000** | **7,605,801** | **2,435,022** | **5,170,779** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කඩ කුලී, බදු ගාස්තු, සේවා ගාස්තු සහ දඩ මුදල් ආදිය නියමිත පරිදි අයකර ගැනීමේ මන්දගාමී ස්වරූපයක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ රැස් කර තිබූ ආදායම් එකතුව රු.මිලියන 2.63 ක් සමාලෝචිත වර්ෂයට අදාළ එවැනි ආදායම් රු.මිලියන 10.02 කින් සියයට 26 ක් සහ පසුගිය වර්ෂවල අයකර ගත යුතුව තිබූ එකතුව රු.මිලියන 15.4 කින් සියයට 16කුත් වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂ අවසානයේ | හිඟ ආදායම් නියමිත පරිදි තක්සේරු කර වාර්ෂිකව ඒවා අයකිරීමට කටයුතු කළ යුතුය. එසේම හිඟ හිටව පවතින ඒවායේ කාල විශ්ලේෂණය ද වාර්ෂිකව පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වර්ෂයේ සිට හිඟ ආදායම්වල කාල විශ්ලේෂණයන් පදනම් කර ගනිමින් වාර්තා නිකුත් කෙරේ. |

පැවති හිඟ ආදායම්වල කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කඩ බදු, ත්‍රී රෝද රථ බදු සහ බදු කුලි හිඟ මුදල්වල එකතුව රු. 151,131ක් විය. එම මුදල අයකර ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වර්ෂ 06 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වර්ෂ 06කට අධික කාලයක සිට හිඟ හිටව පවතින බදු ගාස්තු රු 86,681ක් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ගත යුතුය. | සභාවේ පසුගිය වර්ෂය සඳහා වූ කඩ කුලී, ත්‍රී රෝද රථ බදු සහ බදු කුලි හිඟ මුදල්වල එකතුව රු. 64,450ක් අයකර ගෙන තිබුණි. |

**2.2.4 උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.9,784,171 ක උසාවි දඩ මුදල් සහ රු. 254,034ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | සභාවට අයත් උසාවි දඩ මුදල් ඒවා හිමිකම් පෑමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලීම් කිරීමෙන් ලබාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | උසාවි දඩ මුදල් මින් ඉදිරියේදි ලැබෙනු ඇත. එමෙන්ම මුද්දර ගාස්තු රු. 254,034කින් රු 252,549.00ක් අයකර ගෙන ඇත.ඉතිරි රු. 1,485.00ක් අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ සියළුම වර්ගයේ ක්‍රියාකාකරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් විධිමත් ආකාරයෙන් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පසුගිය වර්ෂය අවසානයේදී පිළියෙල කර නියමිත අයුරින් අනුමත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) ඒවන විටත් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණි. |

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ බැහැර කරනු ලබන කැලිකසළ, ගිනිතැබීම හා වලදැමීම යන කාර්යයන් පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම තවදුරටත් මන්දගාමී මට්ටමේ පැවතුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සභාව විසින් ඵලදායී ක්‍රමෝපායන් අනුගමනය කර ක්‍රියාත්මක කළ යුතු වේ. | ලැබෙන කසල Compost ප්‍රතිචක්‍රීයකරණ ක්‍රමාපායයන් මගින් භාවිතා කිරීමට ප්‍රමාණවත් නොවන නිසාත් ඒ සඳහා වන යන්ත්‍ර වියදම් අධික බැවිනුත් ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය සිදු කර නොතිබුණි. |

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින බාධක මෙන්ම ඉදිරි ක්‍රියාකාරකම් මැනීම සඳහා දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව ඉදිරියට කරගෙන යාම සඳහා වූ ලේඛන යවා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව අයවැය ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක නොකර එකතුව රු.මිලියන 32.44 ක අරමුදල් පසුගිය වර්ෂ 01 ක සිට වර්ෂ 10ක් දක්වා බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. | ස්ථාවර තැන්පතු උපයෝගී කරගෙන හෝ එහි ආදායමින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සම්බන්ධයෙන් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් නියමිත පරිදි සැලසුම් කර විධිමත් අනුමැතියකින් පසුව ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුය. | සභාවේ ස්ථාවර තැන්පතු ලෙසම 2016 වර්ෂයෙන් පසුව තැන්පත් කර නොතිබූ අතර ඉහත තැන්පතු ආපසු ලබාගෙන සභාවේ සංවර්ධන සහ ආදායම් ඉපැයීමේ කාර්යයන්වල යෙදවීමට කටයුතු යොදා ඇත. |
| (ආ) සභාවට පරිත්‍යාග ලෙස පුද්ගලික ආයතනවලින් ලැබී තිබූ වතුර බවුසරය, ට්‍රැක්ටරය වැනි වාහන 08ක් සභාවට පවරා ගැනීමට මේ දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලැබී තිබූ වතුර බවුසරය, ට්‍රැක්ටරය වැනි වාහන 08ක් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ට්‍රැක්ටරය, ට්‍රේලරය, ගලි බවුසරය සඳහා ලියාපදිංචිය පිළිබඳ විස්තර ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) සභාවට අයත් වතුර බවුසරය සහ ට්‍රේලරය යනාදියෙහි වටිනාකම තක්සේරු කර පසුගිය වර්ෂ 05 සිට වර්ෂ 06 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම් අත්හැරී තිබුණි. | යන්ත්‍රවල වටිනාකම අනුමත තක්සේරුකරුවෙකු විසින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට කටයුතු කළ යුතු වේ. | වතුර බවුසරයේ වටිනාකම 2018 වර්ෂයේ අවසන් ගිණුම්වල ඉදිරිපත් කර ඇත.<br>ට්‍රේලරයේ වටිනාකම මෙම වර්ෂයේදී තක්සෙරු කළ බැවින් මෙම වර්ෂ අවසාන ගිණුම්වල ඇතුළත් කෙරේ. |
| (ඈ) සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ විවිධ වර්ෂයේ පරිගණක 25 ක් සහ උපාංග වටිනාකම පසුගිය වර්ෂ 04 සිට 08 ක් දක්වා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබීමෙන් මූල්‍ය | සභාවට පරිත්‍යාග කර භාවිතා කරනු ලබන පරිගණක සහ උපාංග වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ආ යුතුයි. | නියමිත විවිධ වර්ගවල පරිගණක 25 ක් සහ උපාංගවල වටිනාකම තක්සේරු කමිටුව මාර්ගයෙන් තක්සේරු කර මෙම වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවලින් වටිනාකම අත්හැරී තිබුණි. | | |
| (ඉ) | සභාවට අයත් කාර්යාල උපකරණ සහ ලී බඩු 34 ක වටිනාකම තක්සේරු කර පසුගිය වර්ෂ 05 ක සිට මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබීමෙන් සමාලෝචිත වර්ෂ මූල්‍ය ප්‍රකාශන වලින් ඒවායේ වටිනාකම් අත්හැරී තිබුණි. | සභාවට අයත් කාර්යාල උපකරණ සහ ලී බඩු වල වටිනාකම් තක්සේරු කර සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුයි. | අදාල කාර්යාල උපකරණ, ලී බඩු හා 34 ක වටිනාකම මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ එකතුව රු.මිලියන 6 කට ඇස්තමේන්තු කර තිබූ මූලධන වැඩසටහන් 09 ක් ක්‍රියාත්මක නොකර මුළුමනින්ම අතහැර දමා තිබුණි. මේ සඳහා හේතු විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් කළ විෂයයන් ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2019 වර්ෂයේ සංවර්ධන වැඩසටහනට මාරුකර කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අදාළව අනුමත කළ සේවක සංඛ්‍යාවෙන් ලේකම්, පෙර පැසල් ගුරුවරු, පුස්තකාලයාධිපති, වෙළඳපොළ සුපරීක්ෂකවරු, මේ දක්වා පත්කර නොතිබීමෙන් සභාවේ පරිපාලන ක්‍රියාකාරකම්, පෙර පාසල් අධ්‍යාපන කටයුතු, පුස්තකාල ක්‍රියාකාරකම් සහ වෙළඳපොල ක්‍රියාකාරකම් සුපරීක්ෂණයෙහි මන්දගාමී තත්ත්වයක් නිරීක්ෂණය විය. තාක්ෂණික නිලධාරීගේ පුරප්පාඩුව හේතුවෙන් සභාවේ සංවර්ධන කාර්යයන් නිවැරදිව ක්‍රියාත්මක කිරීමට බාධා වී තිබුණු බව විගණනයට අනාවරණය විය. | සභාවේ දෛනික කටයුතු සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට ලේකම්, පෙර පැසල් ගුරුවරු, පුස්තකාලයාධිපති, වෙළඳපොළ සුපරීක්ෂකවරු, තාක්ෂණික නිලධාරී ආදි තනතුරු අනුමත කළ සේවක මණ්ඩලය ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරියේ 2020 වර්ෂයට අදාල අයවැය සැලැස්මේ මේ සඳහා ගොඩනැගිලි සහ ලී බඩුවලට අදාල ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසුව එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ භාවිතයේ පැවති අලුත්වැඩියා කළ යුතු වාහන 2 ක් පසුගිය මාස 03 – 08 ක් දක්වා අලුත්වැඩියා නොකර ගබඩාවේ පැවතුණි. | වාහන නියමිත කාලයේ අලුත්වැඩියා කර නියමිත පරිදි භාවිතය සඳහා යෙදීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. | ට්‍රැක්ටරය සඳහා විශාල මුදලක් වැයකර කිහිප වතාවක් අලුත්වැඩියා කර තිබුණත් නිතර නිතර අලුත්වැඩියාවන්වලට භාජනය වි අක්‍රීය තත්ත්වයේ පැවතුණි. මෙහි අයිතිය පවරා ගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 3.4.2 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෙවිලි තහඩු 10 ක් වර්ෂයකට අධික කාලයක සිට භාවිතා නොකර ගබඩාවේ පැවති අතර එහි වටිනාකමද විගණනයට ලැබී නොතිබුණි. | සෙවිලි තහඩු වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන ආ යුතුවේ. | තහඩු 10 ක් මල්ලාවි, එළවළු පොළ අලුත්වැඩියාවේදී ඉවත්කර දැනට කාර්යාලයේ තිබේ. මේවා සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලැබේ. එසේම වටිනාකම ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය සැලැස්ම නිවැරදි ක්‍රියාපටිපාටියක් මාර්ගයෙන් සැලසුම් කර පිළියෙල නොකිරීම නිසා ඇස්තමේන්තු කළ වැය විෂයයන් 06 ක ඇස්තමේන්තු ගත සහ තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 52 ක් දක්වා පරාසයක විචලනයන්ද, ඇස්තමේන්තුගත ආදායම් මාර්ග මාර්ග 05 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර පිළිවෙලින් සියයට 14 සිට සියයට 78 ක් දක්වා විචලනයන්ද පැවතුණි. | වාර්ෂික අයවැය සැලැස්මේ පවතින අයවැය විෂයයන් නිවැරදි ක්‍රියාපටිපාටියක් මාර්ගයෙන් තක්සේරු කර ක්‍රියාත්මක කිරීමට සභාව එළදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**4.2 අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කටයුතු පරීක්ෂා කර කාර්යක්ෂමව ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සාර්ථක අන්දමින් කරගෙන යනු ලබන අතර පරීක්ෂණ වාර්තා අභ්‍යන්තර විගණන පරීක්ෂණ ලිපිගොනුවේ ගොනුගත කර ඇති අතර දෝෂයකින් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |